／

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1998/38 - 2016 දෙසැම්බර් මස 23 වැනි සිකුරාදා - 2016.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී - 3/2009(III)

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 27 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 53 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති.

සාලිය මැතිව්,
සභාපති,
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව.

2016 දෙසැම්බර් මස 23 වැනි දින,
කොළඹ.

**රීති**

1. මෙම රීති, 2016 අංක 04 දරන විදුලිබල (විදුලිබල සම්බන්ධතාව සැපයීමේ දී වියදම මුළුමනින්ම ගෙවීම සඳහා ප්‍රමාණවත් වත්කමක් නොමැති බව පිළිබඳ තොරතුරු) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 25 වැනි වගන්තිය යටතේ විදුලිබල සැපයුමක් ඉල්ලා සිටින නමුත් බෙදහැරීමේ බලපත්‍රලාභියෙක් එකී තැනැත්තා වෙත විදුලිබල රැහැනක් හෝ විදුලිබල පිරියතක් හෝ සම්බන්ධතාවක් සහ විදුලිබල සැපයුමක් ලබාදීමේ දී යුක්ති සහගතව දරනු ලබන වියදම් එකවර මුළුමනින්ම ගෙවීමට ප්‍රමාණවත් වත්කමක් නොමැති විට එකී වියදම සම්මත අයක්‍රම ගිවිසුම ප්‍රකාරව බෙදහැරීමේ බලපත්‍රලාභියා අය කරනු ලබන අයක්‍රම සහ වෙනත් ගාස්තු සමඟ යුක්ති සහගත මාසික වාරිකවලින් අය කර ගන්නා ලෙසට බෙදහැරීමේ බලපත්‍රලාභියාගෙන් ඉල්ලා සිටිය හැකිය.

3. එසේ විදුලිබල සැපයුම ඉල්ලා සිටින තැනැත්තාට වියදම මුළුමනින්ම ගෙවීමට ප්‍රමාණවත් වත්කම් නොමැති බවට විදුලිබල රැහැන හෝ විදුලිබල පිරියත හෝ සම්බන්ධතාවය සහ විදුලිබල සැපයුම සැපයීමට පෙර බෙදහැරීමේ බලපත්‍රලාභියා සෑහීමකට පත්වන අවස්ථාවක දී, එම තැනැත්තා විසින් බෙදහැරීමේ බලපත්‍රලාභියා වෙත වියදම් ගෙවන ආකාරය පිළිබඳ ගිවිසුමකට එළඹිය යුතු බවට බෙදහැරීමේ බලපත්‍රලාභියා විසින් එම තැනැත්තාට නියම කළ යුතු ය.

1A - G 24760 — 08 (2016/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. අනාගත ගෘහස්ථ පාරිභෝගිකයෙකුට බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් විදුලිබල සම්බන්ධතාවක් සහ විදුලිබල සැපයුමක් ලබාදීමේ දී දරනු ලබන වියදම් එකවර මුළුමනින්ම ගෙවීම සඳහා ප්‍රමාණවත් වත්කම් තිබෙන්නේ ද යන්න තීරණය කිරීමේ කාර්යය සඳහා වූ නිර්ණායක, කුටුම්බ ආදායම මත තීරණය කළ යුතු ය.

5. බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් විදුලිබල සම්බන්ධතාවක් සහ විදුලිබල සැපයුමක් ලබාදීමේදී දරනු ලබන වියදම් එකවර මුළුමනින්ම ගෙවීම සඳහා අනාගත ගෘහස්ථ පාරිභෝගිකයකුට ප්‍රමාණවත් වත්කම් නොතිබෙන බවට සෑහීමකට පත්වීමේ කාර්යය සඳහා පහත දැක්වෙන නිර්ණායක භාවිතා කළ යුතු ය.

(i) (සැපයුම ඉල්ලා සිටින පරිශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු වන) විදුලිබල සැපයුම ඉල්ලා සිටින තැනැත්තා දිවිනැගුම ප්‍රතිලාභියෙක් වීම, හෝ

(ii) විදුලිබල සැපයුම ඉල්ලා සිටින පරිශ්‍රයේ විදුලිබල සැපයුම ඉල්ලා සිටින අයිතිකරු හෝ පදිංචිකරු ඇතුළු පදිංචිකරුවන්ගේ මාසික කුටුම්බ ආදායම, කුටුම්බ ආදායම් සහ වියදම් සමීක්ෂණය (HIES) මත පදනම් ව ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් දක්වා ඇති ශ්‍රී ලංකාවේ කුටුම්බ මධ්‍යම ආදායමෙන් 50%කට වඩා අඩු වීම.

6. තීරණ ගැනීමේ දී බෙදාහැරීමේ බලපත්‍රලාභියාට අවශ්‍ය කරන තොරතුරුවලට පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු ය :

(i) (විදුලිබල සැපයුම ඉල්ලා සිටින පරිශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු වන) විදුලිබල සැපයුම ඉල්ලා සිටින තැනැත්තා දිවිනැගුම ප්‍රතිලාභියෙක් වන්නේ නම්, අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අනුඅත්සන් කිරීමෙන් සහතික කළ, ග්‍රාම නිලධාරියා විසින් නිකුත් කළ සහතිකයක්, හෝ

(iii) විදුලිබල සැපයුම ඉල්ලා සිටින අයිතිකරු හෝ පදිංචිකරු ඇතුළු පදිංචිකරුවන්ගේ මාසික කුටුම්බ ආදායම ශ්‍රී ලංකාවේ මධ්‍යම කුටුම්බ ආදායමෙන් 50%කට වඩා අඩු වන්නේ නම්, ඒ බව සහතික කරමින් අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නිකුත් කළ ආදායම් තක්සේරු ආකෘති පත්‍රයක්.

7. බෙදාහැරීමේ බලපත්‍රලාභියා විදුලිබල රැහැන, විදුලිබල පිරියත, විදුලිබල සම්බන්ධතාව සහ විදුලිබල සැපයුම ලබාදීමේදී බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් යුක්ති සහගතව දරනු ලැබූ වියදම්, සම්මත අයකුම ගිවිසුම අනුව බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් අය කරනු ලබන අයකුම සහ වෙනත් කිසියම් ගාස්තු සමග යුක්ති සහගත මාසික වාරිකවලින් ආපසු අයකර ගත යුතු ය.

එසේ වුව ද, එවැනි මාසික වාරික -

(i) ප්‍රකාශිත කුටුම්බ ආදායමෙන් 5%ක් නොඉක්මවිය යුතු අතර, උපරිම අඩු කිරීම රු. 1,500කට නොවැඩි විය යුතු ය. (කුටුම්බ ආදායම් හා වියදම් සමීක්ෂණය පදනම්ව ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් කලින් කල දක්වා ඇති ශ්‍රී ලංකාවේ කුටුම්බවල මධ්‍යම ආදායමෙන් සීයයට පහකට සමාන)

(ii) මාස 24කට නොඅඩු කාල සීමවකින් ආපසු අයකර ගත යුතු ය, සහ

(iii) අදාළ වන්නේ නම්, වගා චක්‍රය වැනි ආදායම් රටාවල සෘතුමය වෙනස්කම් සමග සමමුහුර්ත කළ යුතු ය.

8. නියමිත කාලපරිච්ඡේදයට පසුව සම්මත අයකුම ප්‍රකාරව සහ කොමිෂන් සභාව මගින් නියම කළ අනුපාතය මත පමණක් පොළිය අය කළ හැකි ය.

9. බලපත්‍රලාභියා විසින් වයස අවුරුදු 55ට වැඩි වයස්ගත පුද්ගලයින්, විශ්‍රාමිකයින්, ආබාධිත සෙබළුන් වැනි ඉහත නිර්ණායකවලට හසු නොවන අනාගත ගෘහස්ථ පාරිභෝගිකයින්ගේ ඉල්ලීම් ද, විදුලිබල සැපයුම ඉල්ලා සිටින තැනැත්තා පරිශ්‍රයේ හිමිකරු ද යන වග, සහ පරිශ්‍රයේ වපසරිය මෙන්ම නිවාස තත්ත්වය ආදිය ද සළකා බැලිය යුතු වන අතර, එවැනි තැනැත්තන්ට ප්‍රමාණවත් වත්කම් නොමැති බවට සෑහීමකට පත්වීම සඳහා බෙදාහැරීමේ බලපත්‍ර ලාභියා විසින් යෝග්‍ය බවට කල්පනා කරන වෙනත් නිර්ණායක සාධාරණව හා පාරදෘශ්‍යභාවයකින් යුතු ව යොදගත යුතු ය.

10. බෙදාහැරීමේ බලපත්‍රලාභියා අනාගත ගෘහස්ථ පාරිභෝගිකයින් හැර වෙනත් තැනැත්තන් ද සළකා බැලිය යුතු වන අතර, බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් යෝග්‍ය බවට කල්පනා කරන වෙනත් නිර්ණායක තනිව හෝ පාරිභෝගික අයකුම කාණ්ඩය අනුව සාධාරණව හා පාරදෘශ්‍යභාවයකින් යුතු ව යොදගත යුතු ය.

11. එවැනි වෙනත් නිර්ණායක යොදා ගැනීමේ දී ප්‍රමාණවත් වත්කම් නොමැති බව පුද්ගල පාරිභෝගිකයා සහ පාරිභෝගික කාණ්ඩය මෙන්ම සම්බන්ධතාවේ ස්වභාවය හා විෂය පථය සහ ඉල්ලා ඇති විදුලි බලය සැපයීම මත වෙනස්වන බව පිළිබඳ බෙදාහැරීමේ බලපත්‍රලාභියා සැලකිල්මත් විය යුතු අතර බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් හැකි අවස්ථාවල දී සාමාන්‍ය නිර්ණායක යොදා ගන්නා අතරතුර එක් එක් ඉල්ලීම ඒ ඒ අවස්ථාව අනුව සලකා බැලිය යුතු ය.

12. මෙම රීතිවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස :-

''පනත'' යන්නෙන් 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලි බල පනත අදහස් වේ ;

''කොමිෂන් සභාව'' යන්නෙන් 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත යටතේ පිහිටුවනු ලැබූ මහජන උපයෝගීතා කොමිෂන් සභාව අදහස් වේ ;

''බෙදාහැරීමේ බලපත්‍රලාභියා'' යන්නෙන් පනතෙහි 13 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ඇ) (i) (ඇ) ඡේදය ප්‍රකාරව කිසියම් පරිශ්‍රයකට විදුලි සැපයුමක් ලබදීමේ කාර්යය සඳහා හෝ බලයලත් ප්‍රදේශයකට එවැනි ආකාරයකට විදුලිය සැපයුමක් ලබාදීමට හැකියාව ඇති කිරීමේ කාර්යය සඳහා විදුලි බලය බෙදාහැරීමේ සහ සැපයීමට හෝ විදුලි බලය බෙදාහැරීමට හෝ සැපයීමට බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබ ඇති තැනැත්තෙකු අදහස් වේ ;

''ගෘහස්ථ පාරිභෝගිකයා'' යන්නෙන් ගෘහස්ථ පාරිභෝගික අයකුම කාණ්ඩය යටතේ විදුලිබල සැපයුමක් ලබා දී ඇති තැනැත්තකු අදහස් වේ.

01-209

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.